රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 260

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.
1984 ජූනි මස 28 වැනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ය.

**දෙමළ භාෂාව පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිලධාරීන් සහ උපකරණ.**

අංක. 242 හා 1984.03.08 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතර වශයෙනි. දෙමළ භාෂාව පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අතිරේක නිලධාරීන් සහ උපකරණ කොපමණ ද, යන්න දැන ගැනීම අවශ්‍ය ය. එහෙයින්, එක් එක් දෙපාර්තමේන්තුව සහ රජයේ සංස්ථාව යටතේ අවශ්‍යතා ඇස්තමේන්තු කරමින්, මුළු අමාත්‍යාංශය සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු, නිලධාරීන් සඳහා එක් ලැයිස්තුවකුත්, උපකරණ සඳහා තවත් ලැයිස්තුවකුත් සකස් කර මා වෙත ඉදිරිපත් කරන්න.

(අ) නිලධාරීන්:

(I) දැනට අනුමත සේවක සංඛ්‍යාව අනුව, දෙමළ භාෂාව පිළිබඳ විධිවිධාන ක්‍රියාත්මක කළ හැකි නිලධාරීන්/සේවකයින් සංඛ්‍යාව.

(II) දැනට සිටින එවැනි නිලධාරීන්/සේවකයින් සංඛ්‍යාව.

(III) හැකි සියලු ලෙසයින්ම ප්‍රති නියුක්ත කරවීමෙන් පසු අවශ්‍ය අතිරේක සංඛ්‍යාව.

සංඛ්‍යාලේඛන, තනතුරු අනුව දැක්විය යුතුය.
උදා: යතුරු ලේඛක, භාෂා පරිවර්තක.

(ආ) උපකරණ:

යතුරු ලියන වැනි උපකරණ සම්බන්ධයෙන් මෙවැනි සංඛ්‍යා ලේඛන.

02. කරුණාකර, ඉහත දැක්වෙන තොරතුරු 1984.07.31 දිනට පෙර මට ලැබෙන සේ එවන්න.

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.